# බහුවාදය සහ සුචරිතවාදය

**මේ සටහන ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ හැඳින්වීමක් පොතේ (පළමු පිණ්ඩයේ) 105 වන පිටුවේ දෙවන ඡේදයේ දක්වන නීති අතර ගැටුම සම්බන්ධයෙනි. එහි දක්වන කරුණට වඩා විහිලුකාරී නීති ගැටුම් තිබේ. නිදසුනක් ලෙස ....**

> **ලිංගික ව හැසිරිය හැකි අවම වයස 16 වුවත් 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතේ 286(අ) වගන්තිය හේතුවෙන් ලිංගික දර්ශනයක රගපෑමේ අවස්ථාව 16 ත් 18 ත් අතර තැනැත්තියකට අහිමි වේ. ඒ 18 ට අඩු බැවින් ඇය ළමයෙකු ලෙසින් සැලකීම නිසා ය.**

**මීට පිළියම් වශයෙන් වයස 16 අර්ධ වැඩිහිටිභාවයක් බවට පත් කළ යුතු ය. එවිට ලිංගික ව හැසිරීමේ වයස විවාහ විය හැකි වයසට වඩා අඩු වයසක් වීමෙන් පැන නැගිය හැකි බව කියන සුචරිතවාදී සමාජයක පමණක් සිදුවන ඊර්ෂ්‍යා ව්‍යසන ගැන මෙවැනි බයිලා (හැඳින්වීම පළමු පොතේ දෙවන ඡේදය) පැවසීමට ඉඩක් නැති වනු ඇත.**

---

## සාරාංශය

මොවුන් පවසන පරිදි විවාහ විය හැකි වයසත් ලිංගික ව හැසිරිය හැකි වයසත් අතර අන්තරයක් ඇති වීම ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකයේ නොකර හැරීමක් හෝ වැරදීමක් නිසා ඇති වූවක් නම් එවැනි තත්ත්වයක් පවතින අනෙක් රටවල්ද හොඳ සිහියෙන් කටයුතු කර නොමැති විය යුතු ය. මගේ නම් අදහස අනිකුත් රටවල ව්‍යවස්ථාදායකයන් මෙන් ම ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයද මෙතන නීති ගැටුමක් දකින අයට වඩා හොඳ සිහියෙන් කටයුතු කර ඇති බවයි.

විවාහ වන වයස බොහෝ රටවල 18 ක් හෝ වැඩි වයසක් වන්නේ කාන්තාවක් දරු ප්‍රසූතියට සුදුසු තරමින් මුහුකුරා යන වයස එය බැවිනි. ලිංගික ව හැසිරීමට අවම වයසක් යොදා ඇත්තේ ලිංගික සබඳතාවයකට තරම් කායිකවත් මානසිකවත් නොවැඩුණු තැනැත්තියක ව ආරක්ෂා කිරීමට ය. ඒ අරුතින් සැලකූ විට නම් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් සිදුවන වයස විය යුත්තේ 16 නොව 15 හෝ 14 ය.

විවාහයට පෙර ලිංගික ව හැසිරීමට මින් නෛතික ඉඩ ලැබෙන බව ඇත්තකි. එය මොවුන් පවසන පරිදි ව්‍යවස්ථාදායකයේ නොසැලකිල්ලෙන් ඇති සිදු වූ විෂමතාවක් නොව ලෝකයේ හැම දියුණු රටක ම නීතියෙන් තිබිය යුතු ඉඩකි. විවාහයට පෙර ප්‍රේම සබඳතා පැවැත්වීමට හැකි වීම ගැන ගැටලුවක් කිසිවකුට නැත. ප්‍රේම සබඳතාවක් තුළ ඔවුන්ගේ සබඳතාවයේ තීව්‍රතාවය මත ලිංගික සබඳතාවයන්ද සිදුවිය හැකි බවද සැවොම පිළිගනු ඇත. එසේ නම් විවාහයට පෙර ලිංගික සබඳතාවයන්ට ඉඩ ලැබීම නීති ගැටුමක් නිසා ඇති වූ විෂමතාවක් වන්නේ කෙසේ ද? මොවුන් කියන මේ ව්‍යවස්ථාදායකයේ වැරදීම හෝ නොසැලකිල්ල හේතුවෙන් වුව සිදු ව ඇත්තේ මානව අයිතිවාසිකමක් සුරක්ෂිත වීමකි.

ගැහැනු ළමයා ව වයෝපූර්ණත්වයට පැමිණෙන තෙක් පරිවාස භාරයේ රඳවා තැබීමට සහ පිරිමි ළමයාට නඩු පැවරීමට තුඩු දෙන නීතිමය ප්‍රතිපාදන ඉවත් කිරීමෙන් මේ ගැටලුවට විසඳුම් සැපයිය හැකි ය. වයස 16 න් සිය කැමැත්ත මත අර්ධ වැඩිහිටි භාවය ලබාගත හැකි ප්‍රතිපාදයක් ඇති කිරීම වැන්නක් මා යෝජනා කරමි. එවිට ඔවුන්ට ගැටලුවකින් තොර ව විවාහ විය හැකි වයස වන තෙක් එකට වාසය කළ හැකි ය. ගැබ්ගැනීමක් ගැන මොවුන් කතා කරති. බබාසුන් කිරීම(**self abortion**) පූර්ණ වසයෙන් (කිසිදු නිර්ණායකයකින් තොර ව) නීත්‍යානුකූල කළ විට එයද විසඳෙනු ඇත.

මෙහි දී සැලකිල්ලට ගත යුතු අනෙක් කරුණ වන්නේ නීතිය හැදින්වීමේ පාඨ ග්‍රන්ථයේ කථා පුවත ඇතිවන්නේ රහසේ පැනයාමක් සිදු වුවහොත් පමණක් බවයි. රහසේ පැන යාමක් සිදුවන්නේ නීති අතර සිදුවන ගැටුමක් හේතුවෙන් නොව ලාංකීය සමාජයේ (සුචරිතවාදී) වැඩිහිටියන්ගෙන් යොවුනන්ගේ සබඳතාවන්ට වන අඩන්තේට්ටම් හේතුවෙනි. විවාහ පූර්ව මෛථුන්‍ය ගැන ඔවුන් තුළ පැසුණු ආකල්පයක් ඇත්නම් සහ අනුන්ගේ ජීවිතවලට අත තැබීමට යාමේ නරක පුරුද්ද අත් ඇරගන්නේ නම් මේ ගැටලුව ඇතිවන්නේ ම නැත.

---

ශ්‍රී ලංකාවේ නීතිය ගැන හැදින්වීමේ පළමු පිඩුවේ අවසන් පාඩම ශ්‍රී ලංකා නීති ක්‍රමය තුළ බහුවාදය පිළිබඳ ගැටලු ය. විවිධ පෞද්ගලික සහ සාමාන්‍ය නීතියේ ප්‍රතිපාදන හේතුවෙන් පැන නගින ගැටලුවලට අමතර ව ව්‍යවස්ථාදායකයේ නොකර හැරීම් හෝ වැරදීම් නිසාද නීති ගැටුම් ඇතිවිය හැකි යැයි පවසන කතුවරු නිදසුන් කීපයක් දක්වති. පළමුවැන්න සාමාන්‍ය විවාහ ආඥාපණතේ 22 වගන්තියත් ඒ පණතේ ම 15 වගන්තියත් අතර ඇති ගැටුමයි. ඒ ගැන මට ගැටුමක් නැත. නමුත් ඊළග නිදර්ශනය සමග නම් මට බරපතල ගැටුමක් ඇත.

විවාහ විය හැකි අවම වයස 18 වීම නිසා මෙම විෂමතාවය හෙවත් නීති ගැටුම සිදු වී ඇතැ යි එහි සඳහන් වේ. ඔවුන්ට අනුව එම විෂමතාවය නම් විවාහ විය හැකි වයස 18 වීමත්, ලිංගික ව හැසිරිය හැකි අවම වයස 16 වීමත් ය. මීට ඉහත අවස්ථාව නම් පැහැදිලි ව නීතියේ අර්ථ විරහිත තත්ත්වයක් ඇති වීමකි. ඒ බව 104 පිටුවේ අවසන් ඡේදය කියවීමෙන් පසක් වේ. නමුත් මෙතන ඇති එවැනි තත්ත්වය කුමක් ද? ලංකාව පමණක් නොව ඉන්දියාව වැනි ආසියාතික සංස්කෘතියක් සහිත රටක මෙන් ම බටහිර යුරෝපීය රටවලත් විවාහ විය හැකි වයසත් ලිංගික ව හැසිරිය හැකි වයසත් එකක් නොව දෙකකි. මොවුන් පවසන පරිදි යට කී ආකාරයෙන් විවාහ විය හැකි වයසත් ලිංගික ව හැසිරිය හැකි වයසත් අතර අන්තරයක් ඇති වීම ශ්‍රී ලංකා ව්‍යවස්ථාදාකයේ නොකර හැරීමක් හෝ වැරදීමක් නිසා ඇති වූවක් නම් එවැනි තත්ත්වයක් පවතින අනෙක් රටවලට සිදු වී කුමක් ද? ඔවුන්ද හොඳ සිහියෙන් කටයුතු කර නැත් ද? මගේ නම් අදහස අනිකුත් රටවල ව්‍යවස්ථාදායකයන් මෙන් ම ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයද මෙතන නීති ගැටුමක් දකින අයට වඩා හොඳ සිහියෙන් කටයුතු කර ඇති බවයි.

විවාහ වන වයස බොහෝ රටවල 18 ක් හෝ වැඩි වයසක් වන්නේ කාන්තාවක් දරු ප්‍රසූතියට සුදුසු තරමින් මුහුකුරා යන වයස එය බැවිනි. ලිංගික ව හැසිරීමට අවම වයසක් යොදා ඇත්තේ ලිංගික සබඳතාවයකට තරම් කායිකවත් මානසිකවත් නොවැඩුණු තැනැත්තියක ව ආරක්ෂා කිරීමට ය. ඒ අරුතින් සැලකූ විට නම් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් සිදුවන වයස විය යුත්තේ 16 නොව 15 හෝ 14 ය. SAFE Report : A Reference Guide to Sexuality Education in Europe නම් කෘතියේ දක්වා ඇති පරිදි ස්වීඩනයේ මෙය 14 කි. එක්සත් රාජධානිය ඇතුලු අනිකුත් බොහෝ රටවල මෙය 15 කි.

විවාහයට පෙර ලිංගික ව හැසිරීමට මින් නෛතික ඉඩ ලැබෙන බව ඇත්තකි. එය මොවුන් පවසන පරිදි ව්‍යවස්ථාදායකයේ නොසැලකිල්ලෙන් ඇති සිදු වූ විෂමතාවක් නොව ලෝකයේ හැම දියුණු රටක ම නීතියෙන් තිබිය යුතු ඉඩකි. විවාහයට පෙර ප්‍රේම සබඳතා පැවැත්වීමට හැකි වීම ගැන ගැටලුවක් කිසිවකුට නැත. ප්‍රේම සබඳතාවක් තුළ ඔවුන්ගේ සබඳතාවයේ තීව්‍රතාවය මත ලිංගික සබඳතාවයන්ද සිදුවිය හැකි බවද සැවොම පිළිගනු ඇත. එසේ නම් විවාහයට පෙර ලිංගික සබඳතාවයන්ට ඉඩ ලැබීම නීති ගැටුමක් නිසා ඇති වූ විෂමතාවක් වන්නේ කෙසේ ද? මොවුන් කියන මේ ව්‍යවස්ථාදායකයේ වැරදීම හෝ නොසැලකිල්ල හේතුවෙන් වුව සිදු ව ඇත්තේ මානව අයිතිවාසිකමක් සුරක්ෂිත වීමකි.

මේ හේතුවෙන් ඇති විය හැකි ගැටලුව ලෙස පහත පරිදි රසවත් කථාපුවතක් එහි ඉදිරිපත් කෙරේ.

එවැනි අවස්ථාවක දී වයස *16* ට වැඩි ගැහැණු ළමයෙක් තරුණ පිරිමි ළමයෙක් සමග ප්‍රේම සබඳතාවක් ආරම්භකොට ඔහු සමග රහසේ පැන ගියහොත්, ඔවුනට දෙමාපිය කැමැත්ත ඇති ව පවා විවාහ විය නොහැක්කේ විවාහ විය හැකි අවම වයස *18* ක් වන හෙයිනි. එවැනි බොහෝ අවස්ථාවල දී ගැහැණු ළමයාගේ දෙමාපියෝ ඇය ආපසු භාර ගැනීම ප්‍රත්ක්ශේප කරති. පිරිමි ළමයාට ගැහැණු ළමයා විවාහ කර

ගත නොහැක්කේ ඇය විවාහ විය හැකි අවම වයසට වඩා අඩු වයසක සිටින නිසා ය. මෙවැනි තත්ත්වයක් යටතේ පොලීසිය ඔවුන් ව අත්අඩංගුවට ගෙන ඔවුන් අධිකරණයක් හමුවට ඉදිරිපත් කළ විට, නොවැළැක්විය හැකි පරිදි ගැහැණු ළමයා වයස් පූර්ණත්වය අත්කරගන්නා තෙක් ඇය ළමා නිවාසයක රඳවා තබනු ලැබේ. ඇගේ අධ්‍යාපනය කඩාකප්පල් වන අතර දෙමාපිය භාරයෙන් බාලවයස්කාරියක පැහැරගෙන යාමේ වරද සම්බන්ධයෙන් පිරිමි ළමයාට එරෙහි ව නඩු පවරනු ලැබේ. ඇය වයස් පූර්ණත්වය අත්කරගන්නා විට වර්ෂ දෙකක කාලයක් තිස්සේ හමු නොවීම නිසා සමහරවිට ගැහැණු ළමයාගේ හෝ පිරිමි ළමයාගේ සිත් වෙනස් වීමට ඉඩ තිබේ. අවසානයේ ඔවුන් දෙදෙනාගේ සම්බන්ධය කැඩී බිඳී යා හැකි ය. ඔවුන් රහසේ පැන ගිය දිනයේ ඔවුන් අතර ලිංගික සබඳතාවක් ඇති වී ගැහැණු ළමයා ගැබ් ගතහොත් හා ඇය ප්‍රසූත කරන දරුවාගේ පියා දරුවාගේ පීතෘත්වය ප්‍රතික්ශේප කළහොත්, විවාහයෙන් පරිබාහිර ව උපත ලත් දරුවකුගේ බර ඇය විසින් තනිව ම දරා ගත යුතු වේ.

(ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ හැඳින්වීමක් - පළමු වන පිඩුව – 105 වන පිටුවේ දෙවන ඡේදය)

ගැහැනු ළමයා ව වයෝපූර්ණත්වයට පැමිණෙන තෙක් පරිවාස භාරයේ රඳවා තැබීමට සහ පිරිමි ළමයාට නඩු පැවරීමට තුඩු දෙන නීතිමය ප්‍රතිපාදන ඉවත් කිරීමෙන් මේ ගැටලුවට විසඳුම් සැපයිය හැකි ය. වයස 16 න් සිය කැමැත්ත මත අර්ධ වැඩිහිටි භාවය ලබාගත හැකි ප්‍රතිපාදයක් ඇති කිරීම වැන්නක් මා යෝජනා කරමි. එවිට ඔවුන්ට ගැටලුවකින් තොර ව විවාහ විය හැකි වයස වන තෙක් (ලිංගික සබඳතා පවත්වමින් හෝ නොපවත්වමින්) එකට වාසය කළ හැකි ය. ගැබ්ගැනීමක් ගැන මොවුන් කතා කරති. බබාසුන් කිරීම(self abortion) පූර්ණ වසයෙන් (කිසිදු නිර්ණායකයකින් තොර ව) නීත්‍යානුකූල කළ විට එයද විසඳෙනු ඇත.

ඒ නිසා මෙහි ගැටුම (හෙවත් අසාධාරණය) පවතින්නේ එසේ ගැහැනු ළමයා වයෝපූර්ණත්වය තෙක් සිරකර තැබීමට සහ 18 ට අඩු මුත් සිය පෙම්වතිය වන අය සමග ඇයගේ මව්පියන්ගෙන් බැහැර තැනක වාසය කිරීමේ වරදට දඬුවම් විඳීමට සිදුවීමෙහිත් ය. එය නීතියෙන් වරදක් වීම ඔවුන්ගේ ලිංගික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් මෙන් ම ලිංගිකත්ව හා පුද්ගල සබඳතා අධ්‍යාපනය සම්බන්ධයෙන් නූතන ලෝකය පිළිගත් ප්‍රමිතීන් සපුරාලීමටද බාධාකරවන තත්ත්වයකි.

මෙහි දී සැලකිල්ලට ගත යුතු අනෙක් කරුණ වන්නේ නීතිය හැඳින්වීමේ පාඨ ග්‍රන්ථයේ කථා පුවත ඇතිවන්නේ රහසේ පැනයාමක් සිදු වුවහොත් පමණක් බවයි. රහසේ පැන යාමක් සිදුවන්නේ නීති අතර සිදුවන ගැටුමක් හේතුවෙන් නොව ලාංකීය සමාජයේ (සුචරිතවාදී) වැඩිහිටියන්ගෙන් යොවුනන්ගේ සබඳතාවන්ට වන අඩන්තේට්ටම් හේතුවෙනි. විවාහ පූර්ව මෛථුන්‍ය ගැන ඔවුන් තුළ පැසුණු ආකල්පයක් ඇත්නම් සහ අනුන්ගේ ජීවිතවලට අත තැබීමට යාමේ නරක පුරුද්ද අත් ඇරගන්නේ නම් මේ ගැටලුව ඇතිවන්නේ ම නැත.

නමුත් මා ඒ බව  මීට වෙනස් වචනවලින් පැවසූ විට (මෙහි සඳහන් බොහෝ කරුණු ඒ අවස්ථාවේ සිතට ආවේ නැත.) දේශකවරයාගෙන් මෙන් ම සමහර සගයන්ගෙන් ද ලැබුණු වික්ටෝරියානු ප්‍රතිචාර මධ්‍යයේ මම මවිතයටත් කණස්සල්ලටත් පත් වීමි. විවාහ පූර්ව මෛථුන්‍ය සම්මත ලෝක චරිත්‍රයක් බව කී විට කෙනෙක් කීවේ ලංකාවේ චාරිත්‍රය මීට වෙනස් බව ය. උසස් පෙළ ව්‍යාපෘතිය වසයෙන් ශ්‍රී ලංකාවේ [ලිංගිකත්ව අධ්‍යාපනය]() තෝරාගනිමින් මා කළ අධ්‍යයනය උදෙසා පරිශීලනය කළ Emerging Issues Among Sri Lankan School-going Adolescents නමින් Thalagala N. [1]සහ සෙසු අය විසින් කරන ලද සමීක්ෂණයේ දි හෙළිදරව් වී තිබුණේ  ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් අතර ලිංගික ව හැසිරීම් ප්‍රතශතය 20%ක් බවයි. සාමාන්‍යයෙන් කෙනකුගේ රහස්‍යතාවය හා බැඳි පැනවලට සමීක්ෂණයක දී ලැබෙන්නේ (වර්නියර් කැලිපරයක මූලාංක දෝෂය හේතුවෙන් වැඩි අගයක් ලැබෙන්නාක් මෙන්) සත්‍ය අගයට වඩා අඩු අගයකි. ඒ අනුව මේ අගය මීට වඩා වැඩි විය යුතු ය. ඊටත් වඩා අද වනවිට එම සමීක්ෂණයෙන් වසර 14 ක් ගෙවී ඇත. නූතන පරම්පරාව ගමන් කරන්නේ ත්වරණයෙන් වන බැවින් මේ අගය ඇතැම්විට  70%කටත් වඩා වැඩි අගයක් ගැනීමට බොහෝසෙයින් ම ඉඩ ඇත. අඩු තරමේ එය 50%ක්වත් වනු ඇත.  තවත් අධ්‍යනයකට අනුව අන්තර්ග්‍රාහක මෙන් ම නිර්-අන්තර්ග්‍රාහක ක්‍රියාකරම් හරහා ලාංකීය තරුණ පිරිස්වල ලිංගික කළඑළිබැසීම

1 https://www.unicef.org/srilanka/Full_Report.pdf

සිදුවන්නේ වයස 15[2]දී ය. නිරන්තර ව බිදීමට ලක්වන සමාජයේ රුචි අරුචිකම් සමග ගැටෙන නීතියක ඇති ඵලය කුමක් ද?

ලෝක සෞඛ්‍ය සංවිධානය පළකළ WHO Regional Center for Europe and BzgA Standards for Sexuality Education in Europe නම් ප්‍රකාශනයේ[3] ලිංගිකත්ව අධ්‍යාපනයේ මාදිලි 3 ක් ඇතැ යි පවසයි. හුදු වේරමනී වැඩසටහන් හෙවත් බදිනකං පරිස්සං වැඩසටහන් (Abstinence only), වැඩිදියුණු කළ වේරමනී වැඩසටහන් (Abstinence Plus) සහ සාර්වත්‍රික ලිංගිකත්ව අධ්‍යාපන (Holistically Sexuality Education ) නොහොත් වරප්‍රසාදිත ලිංගිකත්ව අධ්‍යාපන වැඩසටහන් ය (Mandatory Programs) . පළමු හා දෙවන ගණයේ වැඩසටහන් අතර දැඩි බෙදුම්කඩනයක් නැති බව පවසන ඔවුන් අනුමත කරන්නේ තුන්වන ගණයේ වැඩසටහන් ය. එය අනික්වායින් වෙන්කර හදුනාගන්නේ ඔවුන් පවසන පරිදි පහත පරීක්ෂණයෙනි.

It is important to stress at this point that Type 3 programmes start from a philosophy that is different from Type 1 and 2. The latter tend to be much more “tangible-results-oriented”, concentrating particularly on behavioural results.

Important questions for the evaluation of these Type 1 and 2 sexuality education curriculums include: “**Is the programme delaying the age of fi rst intercourse?**”; “**Is it reducing the number of sexual partners?**”; or even “**Does it reduce the frequency of sexual intercourse?**”.

මේ කරුණු යුරෝපීය සංස්කෘතියට උචිත විය හැකි මුත් ලංකාවට නුසුදුසු බව කියන මනසකට පිළිතුර ලියෝන් ට්‍රොට්ස්කි සහෝදරාගෙන් ලබා ගත හැකි ය.

දියුණු ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඉතිහාසය විසින් අනෙකුත් රටවලට සිය අනාගතය කවරාකාර වන්නේ දැයි පෙන්වා දෙන බව ලියොන් ට්‍රොට්ස්කි පවසන්නේ ඔක්තෝම්බර් විප්ලවයේ පාඩම් නමැති කෘතියේ ය.

විවාහය නමැති සංස්ථාවට හානි වන කිසිවකට තමා දැඩි ව විරුද්ධ වන බවක් දේශකවරයා මා හට පිළිතුරු දීමේ දී කියා සිටි බවක් මතක ය. විවාහය නම් නෛතික තත්ත්වයෙන් ලැබෙන එක ම ලාභය දරුවන්ගේ දේපල හිමිකම ආරක්ෂා කරදීමට හැකි වීම පමණ ය. ආදරය කිරීමට සහ දරුවන් බිහිකිරීමට, පවුලක් ලෙස ජීවත් වීමට එය අතවශ්‍ය නැත. යුගල බන්ධනය ක්‍රමය බිහිවන්නේ ධනවාදී පෞද්ගලික දේපල ක්‍රමය බිහිවීමේ ඵලයක් වසයෙන් බව එංගල්ස් පෙන්වා දෙයි. පොදු දේපල හිමිකමක් ඇති සමාජයක දේපල උරුමය වෙනුවෙන් විවාහයක් ඇවැසි නැත. සමූපකාර ක්‍රමයේ පියා වසයෙන් ද සැලකෙන මනෝරාජික සමාජවාදියෙක් වූ රොබට් ඕවන් කිතු දහමේ ශුද්ධ ත්‍රිත්වය (Holy Trinity); පියා, පුත්‍රයා සහ ශුද්ධාත්මය යන දෙවියන්වහන්සේගේ ස්වරූපයන් තුන මෙන් ම මනුෂ්‍යාට පීඩා කරන භයංකර ත්‍රිත්වයක් (Awful Trinity) ඇති බව ද පෙන්වා දුන්නේ ය. ඒ විවාහය, පෞද්ගලික දේපල සහ ආගම යි.

ඒක භාර්යා ව්‍රතය සියලු සුචරිතවාදයන්ගේ මුදුන් මල්කඩ නම් එකී සුචරිතවාදයේ ඔටුන්න හිමි විය යුත්තේ බණ්ඩ තුන්සිය ගණනක් තිබෙන සහ එකී සෑම බණ්ඩයක ම ස්ත්‍රී ලිංගයක් සහ පුරුෂලිංගයක් බැගින් ඇති පටිපණුවාට බව එංගල්ස් තම පවුල, පෞද්ගලික දේපල සහ රජය ඇති වූ සැටි ග්‍රන්ථයේ පවසා තිබේ. එංගල්ස් එම කෘතිය ලියන්නේ සදාචාරය යනු ඒ ඒ යුගයේ දේපල අවශ්‍යතා මත ගොඩනැගෙන කෘත්‍රිම දෙයක් ය යන විද්‍යාත්මක සමාජවාදයේ ප්‍රවාදය මෝර්ගන් නම් මානව විද්‍යාඥයාගේ සොයාගැනීම් තුළින් තහවුරු වන සැටි පෙන්වා දීමට ය.

කන්‍යාභාවය විශුද්ධ චරිතාංගයක් ලෙස පැරණි සිංහල ගැමියන් නොසැලකූ බව වික්‍රමසිංහ නවකතාංග හා විරාගය කෘතියේ පවසයි. ආර්ය්‍යා ගෝත්‍රයේ ඇත්තෝ සමාජ තහංචි බිදීම යථාර්ථයෙන් ගත් ජාතියක් යැයි සයිමන් නවගත්තේගම සාහිත්‍ය, සමාජවාදය හා කලා විචාරය කෘතියේ පවසයි. විජය-කුවේණි, සිංහබාහු පුවත් හෙතෙම ගෙනහැර දක්වයි. සිංහල බෞද්ධ පුනර්ජීවනය සමග වික්ටෝරියානු කුලකත දේශීයකරණය

2 Agampodi SB, Agampodi C. & Piyaseeli UKD (2008) **Adolescents’ perception of Reproductive Health care Services in Sri Lanka**. BMC Health Services Research. 2008; 8:98.
3 http://www.oif.ac.at/fileadmin/OEIF/andere_Publikationen/WHO_BZgA_Standards.pdf

කොට හෙළ කුල කතක් සේ පරමාදර්ශගත කළ බවත්; යටත්විජිතවාදය විසින් වික්ටෝරියානු සාරධර්ම ලාංකීය තත්වය මත උත්තරාරෝපණය කෙරුණු බවත්; කතෝලික, ක්‍රිස්තියානි, මිෂනාරි දහම්, වික්ටෝරියානුවාදය ආදිය මගින් ලාංකික ලිංගික සංස්කෘතිය සහ භාවිතාව හැඩ ගැස්වීමට එරෙහිව පැරණි නිදහස් ලිංගික සබඳතා වෙනුවෙන් බෞද්ධ භික්ෂූහු පවා විරෝධය පෑ බවත් කේ. කේ. සමන් කුමාර නූතනවාදය වෙතට සහ එයින් ඔබ්බට පොතේ පවසයි.

මා ඉහත ඊනියා නීති ගැටුම ගැන අදහස් දැක්වූ විට දේශකවරයා දැක්වූ බිම්ආසියා කොලය වූයේ ශිරානි තිලකවර්ධන විනිසුරුවරිය මෙහිදී ගැහැනු ළමුන්ට සිදුවන අභාග්‍ය ගැන නීතිය සගරාවකට මනා ලිපියක් ලියා තිබෙන බව ය. (මා එය හමුවුණු විගස කියවමි.) ශිරාණි තිලකවර්ධන ගැහැනියක් බව  දනිතත් ස්ත්‍රීවාදිනියක් දැයි නොදනිමි. ස්ත්‍රීවාදයේ මාතාව වසයෙන් සැලකෙන්නේ ප්‍රංශ දාර්ශනික සිමොන් ද බෝවා ය. ඇය සහ ඇය විසින් යාවජීව ජීවන සබඳතාවක් පවත්වා ගත් තවත් ප්‍රංශ දාර්ශනිකයෙකු වූ නොබෙල් ත්‍යාගලාබී ශෝන් පෝල් සාත්‍ර යන දෙදෙනා ම එවක ප්‍රංශයේ වූ ලිංගික ව හැසිරීමේ අවම නෛතික වයස් සීමාවන් අහෝසි කරන ලෙස උද්ඝෝෂණ කළ බව නම් මම දනිමි. පශ්චාත් ස්ත්‍රීවාදීන් ද නවයොවුන් ස්ත්‍රීන්ට තමන් ව පූර්ණ ලෙස ප්‍රකශයට පත්කිරීමට ඉඩ හරිමින් ඔවුන්ගේ ආස්ථානයන් දිරිමත් කළ බව කේ. කේ සමන් කුමාර  සාහිත්‍ය ෂානර විමංසා කෘතියේ පවසයි. නිදහස් ආලය (Free Love Movement) ව්‍යාපාරයද තවත් දේ අතර ලිංගික ව හැසිරීමේ අවම වයස් සීමාවන් සමගද සටන් කළහ.

මීට අමතර ව තමන් සමසරාගිකත්වට නෛතික ඉඩ ලැබෙනවාට අකමැති බවක් ද දේශකවරයා ඇඟවූ සේක. සමලිංගිකභීතිකාවෙන් හෙවත් Homophobia වෙන් පෙළෙන තවත් අය ඇත්නම් ෆේස්බුක් අඩවියේ දේදුනු සංවාද නම් පිටුවේ පළකිරීම් කියවීමෙන් සුවකරගත හැකි ය.

ඥාණසාර හිමියන්ගේ මෙන් ම මගේද අදහස් පළකිරීම කර්කශ ය. නිර්මාණාත්මක ලේඛනයේ දී ප්‍රහාරාත්මක වැකි මට නම් නැතුව ම බැරි ය. කවරකුටවත් රිදවීමේ, අපහාස කිරීමේ චේතනාවක් මා තුළ නොවිණ. එහෙයින් නුවණැත්තෝ සමාව වදාරන සේක්වා!

(මෙම සමූහයේ මෙය බෙදා ගැනීම වරදක් විය හැකි ය.  නමුත් නීතිපාඨග්‍රන්ථයට සුචරිතවාදය කාන්දු වීම ඊට වඩා වරදකි.)

මගේ උබුන්ටු 16.04 මෙහෙයුම් පද්ධතියේ සිංහල යුනිකේත යතුරුලියනයේ දී සඤ්ඤක අක්ෂර සටහන් නොවන හෙයින් එවැනි තැන් නිසි ලෙස මනසින් සකසා ගනිමින් කියවන්න. ලිනක්ස් පාරිසරිකය තුළ ධාවනය කළ හැකි කී මැන් වැනි පහසුකමක් තවමත් හමු නොවූ බැවින් සාමාන්‍ය අක්ෂර විලාසිතා භාවිත කළ නොහැකි විය.

---


සචින්ත මදූශාන්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නීතිවේදී පාඨමාලාව

තෙවන මට්ටම

ලියාපදිංචි අංකය – **516101565**